# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1563/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 10/10/2024<br>පැය 1325 |

**මාධ්‍ය නිවේදනය**

**2024 පාර්ලිමේන්තු මැතිවරණයේ නාම යෝජනා භාරදීම වෙනුවෙන් නාරාහේන්පිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අවට ක්‍රියාත්මක රථවාහන සැලැස්ම.**

2024.11.14 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය සඳහා කොළඹ දිස්ත්‍රික් නාම යෝජනා භාර දීම 2024.10.11 වන හෙට දින නාරාහේන්පිට නිළ මැදුරේ පිහිටි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සිදු කිරීමට නියමිතය.

එමනිසා, 2024.10.11 වන අද දින උදෑසන 08.00 සිට පස්වරු 02.00 දක්වා කාලය තුල බේස්ලයින් මාර්ගය නාරාහේන්පිට හන්දිය සිට පාර්ක් පාර හන්දිය දක්වා කොළඹින් පිටවීමේ (කිරුලපන දෙසට ඇති වම්පස) මංතීරුව වසා තැබීමට කටයුතු කරනු ලබන අතර එම මාර්ගයේම අනෙක් මංතීරුව පාර්ක් පාර හන්දියේ සිට නාරාහේන්පිට හන්දිය දක්වා බොරැල්ල දෙසට ඇතුළුවීමේ මංතීරුව රථවාහන දෙපසටම ගමන් කිරීමට හැකි වන පරිදි විශේෂ රථ වාහන සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලබයි.

<u>රථවාහන ගමනා ගමනය සීමා කිරීමට යෝජිත මංසන්ධි</u>

- මහවත්ත හන්දියෙන් බේස්ලයින් මාර්ගයේ නාරාහේන්පිට දෙසට ඇතුල්වීම සීමා කර එම වාහන තිඹිරිගස්යාය මාර්ගයට හා දාබරේ මාවත දෙසට යොමු කිරීම.
- තිඹිරිගස්යාය පාර කිරුළ පාර හන්දියෙන් කිරුළ පාර රථවාහන ඇතුල් කිරීම සීමා කර එම වාහන හයිලෙවල් මාර්ගය දෙසට යොමු කිරීම.
- උද්‍යාන පාර හයිලෙවල් පාර හන්දියෙන් වාහන ඇතුල් කිරීම සීමා කර හයිලෙවල් මාර්ගයෙන් තුම්මුල්ල දෙසට හා කිරුළපන දෙසට යොමු කිරීම.
- බේස්ලයින් පාර හයිලෙවල් පාර හන්දියෙන් බේස්ලයින් මාර්ගයට ඇතුල් කිරීම සීමා කර එම වාහන තුම්මුල්ල දෙසට හා නුගේගොඩ දෙසට යොමු කිරීම.
- නාවල පාර නාරාහේන්පිට පාර නාවල හන්දියෙන් නාරාහේන්පිට දෙසට වාහන ඇතුල් කිරීම සීමා කර එම වාහන රාජගිරිය දෙසට හා නුගේගොඩ දෙසට යොමු කිරීම.
- නාවල පාර කිරිමණ්ඩල හන්දියෙන් කිරිමණ්ඩල මාවතට ඇතුල් වන වාහන සීමා කර එම වාහන රාජගිරිය දෙසට හා නුගේගොඩ දෙසට යොමු කිරීම

**නාම යෝජනා භාර දීමට පැමිණෙන රථවාහන ගාල් කිරීමට යෝජිත ස්ථාන**

- **පාර්ක් පාර ශාලිකා ක්‍රීඩාංගණයේ රථ ගාල**
- **පාර්ක් පාර ඵුඩ් සිටිය අසල මාර්ගයේ ඩඩ්ලි සේනානායක විද්‍යාලය දක්වා ශාලිකා ක්‍රීඩාංගණය පැත්තේ එක් මංතීරුවක්**
- **බේස්ලයින් පාර පොල්හේන්ගොඩ හන්දිය සිට හයිලෙවල් පාර දක්වා කොළඹට ඇතුල්වන මාර්ගයේ එක් මංතීරුවක්**
- **බේස්ලයින් පාර මහවත්ත හන්දියේ සිට කනත්ත වටරවුම දක්වා කොළඹට ඇතුල් වන මාර්ගයේ එක් මං තීරුවක්**

පොලිස් මාධ්‍ය කොට්ඨාසය